# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,452 - 2006 ජුනි 30 වැනි සිකුරාදා - 2006.06.30

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 796 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 799 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 796 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 800 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පලකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ජූලි මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 ජුනි මස 23 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්‍ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

රාත්තල් 80/88 ප්‍රමාණයේ ෆිෂ් ප්ලේට්, රාත්තල් 80 ප්‍රමාණයේ ෆිෂ් බෝල්ට් සහ නට් මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීම

කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් විෂයයන් මිළදී ගැනීම සඳහා නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කරන මුද්‍රා තබන ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| *විෂය* | *ප්‍රමාණය* |
|---|---|
| ෆිෂ් ප්ලේට් රා. 80 ප්‍රමාණය | යුගල 2000 |
| ෆිෂ් ප්ලේට් රා. 88 ප්‍රමාණය | යුගල 4000 |
| ෆිෂ් බෝල්ට් සහ නට් රා. 80 ප්‍රමාණය | 25,000 |

ඇටෝර්නි බලය පවරනු ලැබූ නියෝජිතයින් මගින් හෝ කෙලින්ම නිෂ්පාදකයින්ට ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැකිය.

02. ආපසු නොගෙවනු ලබන රු. 2,500 ක මුදලක් හෝ පහසුවෙන් මාරු කළ හැකි සමාන විදේශ විනිමය ප්‍රමාණයක් ගෙවා, කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් 2006.08.16 දින ප. ව. 3.00 දක්වා (ශ්‍රී ලංකා වේලාවෙන්) ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවල පමණක් මිළ ගණන් ඉදිරිපත් කළ යුතුය.

03. 2006.08.18 දින ප. ව. 2.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

04. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය මූලස්ථාන කාර්යාලයේදී ටෙන්ඩර්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයින්ට සහභාගි විය හැකිය.

05. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් ගෙනැවිත් භාරදීමට හෝ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකිය.

සභාපති, දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි නොමිලයේ පරීක්ෂාකර බැලිය හැක. වැඩි විස්තර සඳහා කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී විමසන්න.

දුරකථන අංක : 94 (11) 2432044 හෝ 94 (11) 2436818.

07. මෙම විෂයයන් නිෂ්පාදනය/සැපයීම ISO 9001 : 2000/BSEN ISO 9001 : 2000 හෝ වෙනත් පිළිගත හැකි ජාත්‍යාන්තර තත්ව පාලන ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

සභාපති,<br>
දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලය,<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

06-794

---

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය – කළුතර

ආරක්ෂක සේවාවන් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

සංශෝධනයයි

ඉහත කරුණු සම්බන්ධයෙන් 2006.06.23 දින *රජයේ ගැසට් පත්‍රයේ* පළමු ටෙන්ඩර් දැන්වීම පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ. –

ආරක්ෂක සේවාවන් සැපයිය යුතු දිනය 2006.09.01 ;<br>
ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරන අවසාන දිනය 2006.07.07 ;<br>
ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 2006.07.21 ;<br>
ටෙන්ඩර් විවෘත කරන දිනය හා වේලාව 2006.07.21 ප. ව. 3.05.

එස්. හපුආරච්චි,<br>
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති–කළුතර,<br>
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

06-17

---

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය – නිකවැරටිය

නිකවැරටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාල රාජසන්තක කරන ලද සහ වෙන්දේසි දින දක්වා රාජසන්තක කරන ලද මෙතෙක් අයිතිවාසිකම් නොකියන ලද මෙහි පහත සඳහන් ද්‍රව්‍යයන් 2006.07.29 වැනි දින පෙ. ව. 10.00 ට මෙම සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් පරීක්ෂාකර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ මිළදී ගන්නා ද්‍රව්‍යයන් සඳහා එම අවස්ථාවේදී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත්/මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිළදී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

ආර්. එම්. පී. එස්. කේ. රත්නායක,<br>
දිසා විනිසුරු–මහව,<br>
නිකවැරටිය.

2006 මැයි මස 10 වැනි දින,<br>
මහව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| | | |
|---|---|---|
| 01. ඒ. ආර්. 527/05 | අංක 104/7410<br>යමහා යතුරුපැදිය | සී/අංක එෆ්. එස්. බී. 734945<br>අයි/අංක එෆ්. එස්. බී.– 734945 |
| 02. ඒ.ආර්.266/05 | අංක 116-5198<br>සුසුකි යතුරු පැදිය | සී/අංක එෆ්.ආර්. 50 –561762<br>අයි/අංක එෆ්.ආර්.50-561985 |
| 03. 32928/ඊ | අංක 146/2528<br>සුසුකි යතුරු පැදිය<br>අබලන් | සී/අංක බී.ඒ. 41ඒ -158812<br>අයිඅංක 169441 |

| | | |
|---|---|---|
| 04. | අංක 115-9398<br>වාලි යතුරුපැදිය<br>අබලන් | සී/අංක සී.එෆ්.50-2367479<br>අයි/අංක සී.එෆ් 50ඊ-2861479 |
| 05. | අංක 89 ශ්‍රී 9789<br>හොණ්ඩා සුපර් කප්<br>අබලන් යතුරු පැදිය | සී/අංක සී. 50-6033364<br>අයි/අංක සී 50ඊ - 6033418 |
| 06. | –<br>යමහා වැලි වර්ගයේ<br>අබලන් යතුරුපැදිය<br>යමහා | සී/අංක 439/534276<br>අයි/අංක 439/534276<br><br>අයි/අංක 118860 |
| 07. ඒ.ආර්/125/06 | –<br>සුසුකි | සී/අංක බී. ඒ. 41ඒ-105260<br>අයි/අංක 105180 |
| 08. | අංක 111-9112-125<br>සී. සී හොණ්ඩා<br>අබලන් යතුරු පැදිය | සී අංක 125 ටී - 1010775<br>අයි/අංක සී. බී.125 ටී.ඊ.<br>1010778 |
| 09. | 121-7484<br>හොණ්ඩා 50 එල්එල් | සී. අංක එම්. ඩී. 50-1603135<br>අයි. අංක එම්. ඩී.<br>50ඊ- 1603105 |
| 10. | සුසුකි 125-සී. සී.<br>අබලන් | සී. අංක කේ. 125-262488<br>අයි. අංක කේ. 125-266805 |
| 11. | (i) ඩෙන්යා වර්ගයේ<br>ජෙනරේටර් 01<br>(ii) හමර් එකයි<br>(iii) ග්රේවර් වර්ගයේ වතුර මැෂින් 01යි | |
| 12. | ලි. ප. නො. අබලන් අත් ට්‍රැක්ටර් 01<br>ජී. එන්. 12<br>ලී ඉරුම් පට්ටල් 01 | |
| 13. | ඇලුමිනියම් හැලි 01 | |
| 14. ඒ.ආර්. 541/04 | වතුර මෝටර් 01 | |
| 15. ඒ.ආර්. 565/05 | අංක ආර්. 08578 ස්පීඩ්රෝන් පාපැදිය | |
| 16. ඒ.ආර්. 566/05 | අංක ජේ 266185 හීරෝ පාපැදිය | |
| 17. ඒ.ආර්. 153/05 | අංක 622907 ගොල්ඩන් ලයින් පාපැදිය | |
| 18. ඒ.ආර්. 564/05 | අංක ඒ. 4957 ලුමාලා පාපැදිය | |
| 19. ඒ.ආර්. 614/05 | අංක සී. සී. 020162 දරන පාපැදිය | |
| 20. ඒ.ආර්. 218/05 | අංක 02 ඊ ටී 472 දරන ඊස්ටන් පාපැදිය | |
| 21. ඒ.ආර්. 219/05 | අංක 55900432 දරන ලුමාලා පාපැදිය | |
| 22. ඒ.ආර්. 220/05 | අංක 55958219 දරන ලුමාලා පාපැදි 01 | |
| 23. ඒ.ආර්. 221/05 | අංක 1185433 දරන හීරෝ පාපැදි 01 | |
| 24. ඒ.ආර්. 139/05 | අංක 067135 දරන ඒෂියා පාපැදි 01 | |
| 25. ඒ.ආර්. 602/05 | අංක ඒ. 75696 දරන මවුන්ට් පාපැදිය 01 | |
| 26. ඒ.ආර්. 603/05 | අංකය අපැහැදිලි පාපැදිය 01 | |
| 27. ඒ.ආර්. 604/05 | අංක බී . 32981 දරන පාපැදි 01යි | |
| 28. ඒ.ආර්. 94/06 | අංක 0011717 දරන ලුමාලා පාපැදි 01යි | |
| 29. 32394 | අංක 7194090 හීරෝ පාපැදිය | |
| 30. ඒ.ආර්. 616/05 | නොකියා වර්ගයේ ජංගම දුරකථනය -බැටරි චාජරය දුරකථන ආවරණය | |
| 31. ඒ.ආර්. 617/05 | එරික්ෂන් වර්ගයේ ජංගම දුරකථනය | |
| 32. ඒ.ආර්.611/05 | බෑගයක අඩංගු පරණ (රෙදිපිලි අඩංගු බෑග් එකක්) | |
| 33 31938 | සවල් 01 | |
| 34. 31945 | සවල් 01 | |
| 35. 31983 | සවල් 01 | |
| 36. 40248 | සවල් 01 | |
| 37. 40256 | සවල් 01 | |
| 38. 40257 | සවල 01 | |
| 39. 38217 | සවල් 01 | |
| 40. 38218 | සවල් 01 | |
| 41. 39156 | සවල් 01 | |
| 42. 37637 | සවල් 01 | |
| 43. 37639 | සවල් 01 | |
| 44. 37642 | සවල් 01 | |
| 45. 37641 | සවල් 01 | |
| 46. 37640 | සවල් 01 | |
| 47. 37649 | සවල් 01 | |
| 48. 37648 | සවල් 01 | |
| 49. 37647 | සවල් 01 | |
| 50. 40506 | බණ්ඩි කියත් 01 | |
| 51. 37275 | ලී ඉරන ලැලි බංකු 1යි | |
| 52. 31673 | ඉරුම් කියත් 01 | |
| 53. 40733 | ලී ඉරුම් පට්වල් 01 | |
| 54. – | ලී ඉරුම් පට්වල් 05 | |
| 55. – | දහර වානේ බාර් 58 | |
| 56. – | සන්යෝ කැසට් යන්ත්‍රයක් | |
| 57. – | හිස් බෝතල් තොගයක් | |
| 58. – | හිස්කෑන් තොගයක් | |
| 59. – | ලී ඉරුම් කියත් 05 | |
| 60. – | බණ්ඩි කියත් 05 | |

06-706

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - කඩුවෙල

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍ය වෙන්දේසියේ විකිණීම

කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යයන් 2006.07.22 වැනි දින පෙ. ව. 10.00 ට කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණයේදී විකුණනු ලැබේ.

මෙහි පහත ද්‍රව්‍යයන් පිළිබඳව හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරිය වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය

අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂාකාර බැලිය හැකිය.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියේ මිළදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එදිනම මුදල් ගෙවා පස්වරු 4.00 ට පෙර එම භාණ්ඩ අධිකරණයෙන් ඉවත්කර ගෙන යා යුතුය. සියළුම

ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ. වෙන්දේසියට සහභාගිවීම සඳහා පැමිණෙන්නන් සිය ජාතික හැඳුනුම්පත රැගෙන ආයුතුය.

ඒ. ඒ. සී. ජේ. රාජරත්න,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
කඩුවෙල.

2006 ජුනි මස 01 වැනි දින,
කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසි කිරීමට ඇති භාණ්ඩ ලැයිස්තුව

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තර | ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | 52923 | ගෑස් සිලින්ඩර ලොකු (285) | 01 |
| | | ගෑස් ලිප් | 02 |
| 2. | ඒ. ආර්. 4632 | ගෑස් සිලින්ඩර් | 01 |
| 3. | 30205 | ගෑස් සිලින්ඩර් | 02 |
| 4. | 33609 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 5. | 19801 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 6. | 21752 | ගෑස් සිලින්ඩර් | 01 |
| 7. | 38780 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 8. | 13347 | ගෑස් සිලින්ඩර් | 01 |
| 9. | 26209 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 10. | 6002 | හෙයා ඩ්‍රයර් | 01 |
| | | කැසට් රෙකෝඩරය | 01 |
| | | කාන්තා ඔර්ලෝසු | 02 |
| | | වෝක් මන් | 01 |
| | | මිනින්දෝරු උපකරණ කට්ටල | 02 |
| 11. | බී. 4169 | මන්නා පිහි | 02 |
| | | පොරව | 01 |
| 12. | 47555 | කුලුගෙඩි | 01 |
| | | ගල්ඉනි | 02 |
| | | තාච්චි | 01 |
| | | රේක්ක | 01 |
| 13. | 47556 | කුලුගෙඩි | 01 |
| | | යකඩ ඉනි | 01 |
| 14. | 47208 | කුලුගෙඩි | 03 |
| 15. | 47207 | කුලුගෙඩි | 01 |
| | | මිටි | 01 |
| | | බෝරකටු | 05 |
| | | ගල්ඉනි | 01 |
| 16. | 47243 | කම්ප්‍රෙෂර් කූරු | 01 |
| | | කුලුගෙඩි | 01 |
| 17. | බී1804 | කුලුගෙඩි | 07 |
| | | යකඩ කූරු | 05 |
| 18. | 47203 | කුලුගෙඩි | 01 |
| | | යකඩ කූරු | 02 |
| | | මිටි | 01 |
| | | බෝර කටු | 03 |
| 19. | 47201 | කුලුගෙඩි | 03 |
| | | යකඩ ඉනි | 03 |
| 20. | 51747 | වෙලන් ලීයෙන් නිමවන ලද උළුවහු | 04 |
| 21. | බී. 7550 | දිරාගිය පාපැදි | 01 |
| | | සවල් | |
| | | උදළු | |
| 22. | 3523/06 | ඩීසල් ලීටර් 12 ක් අඩංගු කෑන් | 01 |
| 23. | 3524/06 | ඩීසල් ලීටර් 10 ක් අඩංගු කෑන් | 01 |
| 24. | බී 4618 | ව්‍යායාම උපකරණ කට්ටල | 02 |
| 25. | ඒ. ආර්. 7572 | මෝටරෝලා වර්ගයේ ජංගම දුරකථන | 01 |
| 26. | ඒ. ආර්. 7062 | පාපැදි | 01 |
| 27. | ඒ. ආර්. 7520 | පාපැදි | 01 |
| 28. | ඒ. ආර්. 7522 | පාපැදි | 01 |
| 29. | ඒ. ආර්. 7523 | පාපැදි | 01 |
| 30. | ඒ. ආර්. 7524 | පාපැදි | 01 |
| 31. | බී. 1378 | යකඩ පීලි | 01 |
| 32. | 48783 | උදළු එකයි | 01 |
| | | පරණ සවල් | 01 |
| | | කූඩා | 02 |
| 33. | ඒ. 109 | අංක 111-6071 යතුරුපැදිය | 01 |
| 34. | 1709 | අංක 7 ශ්‍රී 6250 අබලන් යතුරු පැදිය | 01 |
| 35. | ඒ. 7308 | අංක 142-0422 දරන ස්කූටරයක් | 01 |
| 36. | 41314 | අංක 205-3438 දරන ත්‍රීවිල් රථය | 01 |
| 37. | 42356 | අංක 206-9645 දරන ත්‍රීවීල් රථය | 01 |
| 38. | 44694 | අංක 59-6351 දරන නිසාන් ව නට් වෑන් රථ | 01 |
| 39. | ඒ. ආර්. 4927 | රත්‍රං අඩංගු යැයි කියනු ලබන මු. තැ. කවර | 01 |
| | | රත්‍රං අඩංගු යැයි කියනු ලබන මු.තැ. කවර | 01 |
| 40. | ඒ. ආර්. 6349 | කැටයම් වළලු | 01 |
| | | කම්බි වළලු | 02 |
| | | රත්‍රං පටි මුදු | 01 |
| | | මල් කරාබු ජෝඩු | 01 |
| | | ගල්බැඳි ගෙලමාල (රන්නොවේ) | 01 |
| | | ඉමිටේෂන් ගෙල මාල | 01 |
| | | ගල් කරාබු ජෝඩු (රන්නොවේ) | 01 |
| | | බෝල එකක් අඩංගු කරාබු ජෝඩු (රන්නොවේ) (මුද්‍රා තබන ලද බෝතලය) | 01 |
| 41. | ඒ. ආර්. 531 | රත්‍රං මුද්දක් අඩංගු මුද්‍රා තබන ලද බෝතලය | 01 |
| 42. | ඒ. ආර්. 6572 | බ්‍රේස්ලට් එකක් අඩංගු මුද්‍රා තබන ලද බෝතල් | 01 |
| 43. | ඒ. ආර්. 6572 | කැරලි හැඩයේ රත්‍රං චේන් එකක් සහ කහ හැඩයේ චේන් එකක් අඩංගු මුද්‍රා තබන ලද බෝතල් | 01 |
| 44. | ඒ. ආර්. 6572 | නිල්පාට ගලක් අල්ලන ලද මුදු අඩංගු මුද්‍රා තබන ලද බෝතල් | 01 |
| 45. | ඒ. ආර්. 6572 | පිරිමි මුදු එකක් සහ පෙන්ඩන් එකක් අඩංගු මුද්‍රාකල බෝතල් | 01 |
| 46. | 6002 | පෙන්ඩන්ට් එකක් අඩංගු මුද්‍රා තබන ලද බෝතල් | 01 |
| 47. | 1153 | රන් දම්වැල් එකක් සහ පෙන්ඩන් එකක් අඩංගු මුද්‍රා තබන ලද බෝතල් | 01 |
| 48. | 9637 | රත්‍රං කැබැල්ලක් අඩංගු මුද්‍රා තැබූ බෝතල් | 01 |
| | 33546 | මුදු එකක් සහ පෙන්ඩන් එකක් අඩංගු මුද්‍රා තැබූ බෝතල් | 01 |
| 49. | 1862 | කැටයම් වළලු | 01 |
| | | කැටයම් වළලු | 01 |
| | | කරමාල | 01 |
| | | ඉති කරාබු ජෝඩු | 01 |
| | | ඉති කරාබු ජෝඩු | 01 |
| | | ජිප්සි කරාබු ජෝඩු | 01 |
| | | ජිප්සි කරාබු ජෝඩු | 01 |
| | | මල් කරාබු ජෝඩු | 01 |
| | | අඩංගු යයි කියනු ලබන මුද්‍රාකල බෝතලය | |
| 50. | 6509 | පෙන්ඩන්ට් | 01 |
| | | කරාබු ජෝඩු | 01 |
| | | අඩංගු යයි කියනු ලබන මුද්‍රාකළ බෝතලය | |

06-705

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## නොතාරිස් පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

කැකිරාව, ඔළුකරඳ හංදිය "සකුරා" හි පදිංචි සිරිවෙට්ටි මොහොට්ටිගේ දාවිත් සිඤ්ඤෝ වන මම අනුරාධපුර දිස්ත්‍රික්කයේ අනුරාධපුර මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ 107 වන අධිකාරියේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජෙනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාටම මෙයින් දන්වා සිටිමි.

එස්. එම්. දාවිත් සිඤ්ඤෝ.

2006 ජුනි මස 13 වෙනි දින,
එස්. එම්. දාවිත් සිඤ්ඤෝ,
"සකුරා"
ඔළුකරඳ හංදිය,
කැකිරාව.

06-725

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

මහරගම වත්තේගෙදර පාර, කුමුදු මාවතේ අංක 133/6ඒ, හි පදිංචි කුරුවිට මුදියන්සේලාගේ පර්සි පෙරේරා ගුණසේකර වන මම කොළඹ දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුලත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ 107 වන අධිකාරයේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

කේ. එම්. පී. පී. ගුණසේකර.

2006 ක් වූ ජුනි මස 16 වන දින,
133/6ඒ, කුමුදු මාවත,
වත්තේගෙදර පාර,
මහරගම.

06-726

## නොතාරිස් ආඥාපනතේ (107 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීම

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩදුම්බර තැපැල් සීමාවට අයත් මැදිවක ග්‍රාම නිලධාරි වසමේ මැදිවක ගමේ පදිංචි එගොඩවෙලේ වලව්වේ නන්දන බංඩාර එගොඩවෙලේ වන මම මෙදින සිට එක් ලිත් මසක් ඉක්ම ගිය කල්හි මහනුවර අධිකරණ කලාපය තුල සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් වරයෙකු වශයෙන් ඇතුලත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්තුමන් වෙත අයදුම්පතක් ඉදිරිපත් කරන බව නොතාරිස් ආඥාපනතේ 7 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එහි පළමුවැනි උපලේඛනයේ "ආ" කොටසේ 2 වැනි වගන්තිය යටතේ මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් දැනුම් දෙමි.

ඊ. ඩබ්ලිව්. එන්. බී. එගොඩවෙලේ.

06-669

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

කටුනේරිය, පහළ කටුනේරිය, 49 ඊ, "සාගර" නිවසෙහි පදිංචි, මීගමුවගේ ඇලෝසියස් ප්‍රනාන්දු වන මම හලාවත අධිකරණ බල ප්‍රදේශය තුල සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයකු වශයෙන් ඇතුළත් වීම පිණිස, නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 7 වන වගන්තිය ප්‍රකාරව මෙදින සිට මාසයක් ඉකුත් වූ පසුව, රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගේ අවසරය ඉල්ලා සිටින බව සියලු දෙනාම වෙත මෙයින් දන්වා සිටිමි.

එම්. ඒ. ප්‍රනාන්දු,

49 ඊ, "සාගර",
පහළ කටුනේරිය,
කටුනේරිය.

06-815

## ඇටර්නි බලය අවලංගු කිරීම

ගාල්ල, වටරැක නැගෙනහිර, පොල්කොරටුව වත්ත පදිංචි නානායක්කාර වෙල්ලාලගේ යසවතී වන මා ගාල්ලේ, ප්‍රසිද්ධ නොතාරිස් එල්. යූ. ගමගේ මහතා ලවා 1996.05.13 වන දින ලියා සහතික කරන ලද අංක 3289 දරන ඇටර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කරන බවත්, මින් ඉදිරියට ඇහලප හේවගේ ප්‍රදීප් නිරෝෂන් සමන්ත කුමාර නමැති අය මාගේ ඇටර්නි බලපත්‍ර ලාභී වශයෙන් කටයුතු නොකරන බවත්, මා වෙනුවෙන් ඔහු මින් ඉදිරියට මාගේ ඇටර්නි බලපත්‍ර ලාභී වශයෙන් කටයුතු නොකරන බවත්, මා වෙනුවෙන් ඔහු විසින් මින් ඉදිරියට කරනු ලබන සියලුම ක්‍රියාවන් අනීතික හා බලරහිත බවත්, ශ්‍රී ලංකා ජනරජයටත් ශ්‍රී ලංකාවාසී සැමටත් මෙයින් දන්වා සිටිනු ලැබේ.

06-684

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

කොටදෙනියාව, මීරිගම පාර පදිංචි ගාර්දි අච්චිගේ ප්‍රේමරත්න වන මම ගම්පහ දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටී ම පිණිස 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

ජී. ඒ. ප්‍රේමරත්න,
නොතාරිස් ප්‍රතිඥාත ලිපිකරු,

2006 ජුනි මස 16 වැනි දින,
මීරිගම පාර,
කොටදෙනියාව.
06-04

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 10/57352/ඩී10/252.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2001.10.26 දින *ගැසට් පත්‍රයේ* සහ 2002.12.09 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මාතර, කොටුව,විල්ප්‍රඩ් ගුණසේකර මාවත, අංක 39 හි බලයලත් වෙන්දේසිකාර එම්.එච්. පී. සිරිවර්ධන විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.12 වැනි දින පෙරවරු 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සියඹලාගස්විල පිහිටි මහබෝලාන මූකලාන (කැබලි අංක 130 හි 1 එස්. පී. පී. 6) නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. රංචාගොඩ විසින් සැකසුණු 1994.06.08 දින හා අංක 4072 දරන පිඹුරේ කැබලි අංක 4 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 1 පර්. 3ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක හම්/ 191/465/85 බී යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 16 වැනි දින,
කොළඹ 3.
ගාලු පාරේ අංක 269,

06-796/13

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 10/53468/ඩී10/191.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1998.01.09 දින *ගැසට් පත්‍රයේ* සහ 1999.05.04 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මාතර, කොටුව,විල්ප්‍රඩ් ගුණසේකර මාවත, අංක 39 හි බලයලත් වෙන්දේසිකාර එම්.එච්. පී. සිරිවර්ධන විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.12 වැනි දින පෙරවරු 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, උඩ බැරගම පිහිටි ආර- ඇහැලමුල්ලබැද්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. රංචාගොඩ විසින් සැකසුණු 1993.05.30 දින හා අංක 4009 දරන පිඹුරේ කැබලි අංක ඒ ලෙස (මෙම ඉඩම අංක එෆ් වී. පී 566 දරන පිඹුරේ කැබලි අංක 169 ලෙස ද දැක්වේ) දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 2 පර්. 0ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හම් 27/337/87 ඒ යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 16 වැනි දින,
කොළඹ 3.
ගාලු පාරේ අංක 269,

06-796/12

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 10/58424/ඩී10/278.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2000.02.25 දින *ගැසට් පත්‍රයේ* සහ 2000.11.20 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මාතර, කොටුව,විල්ෆ්‍රඩ් ගුණසේකර මාවත, අංක 39 හි බලයලත් වෙන්දේසිකාර එම්.එච්. පී. සිරිවර්ධන විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.12 වැනි

දින මධ්‍යාහ්න 12.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශය තුළ උඩ බැරගම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උඩ බැරගම පිහිටි ඉගිනියන්ගහලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. රංචාගොඩ විසින් සැකසුණු 1994.10.03 දින හා අංක 4128 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 2 පර්. 0 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක හම් 27/1848/87 ඒ යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී පිඹුරේ දැක්වෙන මාර්ග අයිතීන්ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 ජූනි මස 16 වැනි දින,
කොළඹ 3,
ගාලු පාරේ අංක 269.

06-796/8

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 10/69564/ඩී10/623.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.07.22 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.09.27 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මාතර, කොටුව,විල්ප්‍රඩ් ගුණසේකර මාවත, අංක 39 හි බලයලත් වෙන්දේසිකාර එම්.එච්. පී. සිරිවර්ධන විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.12 වැනි දින පස්වරු 4.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩ බැරගම ග්‍රාමයේ පිහිටි ආර ඉහළ මුල්ල බැද්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඊ. එම්. ප්‍රේමසිරි විසින් සැකසුණු 1998.01.18 දින හා අංක 980103 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 1 රූ. 2 පර්. 7 ක්වූ දේපළ සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක හම්/24/1505/87 ඒ යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී පිඹුරේ දැක්වෙන මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 ජූනි මස 16 වැනි දින,
කොළඹ 3,
ගාලු පාරේ අංක 269.

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 10/60388/ඩී10/366.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2001.06.15 දින *ගැසට් පත්‍රයේ* සහ 2002.05.06 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මාතර, කොටුව,විල්ප්‍රඩ් ගුණසේකර මාවත, අංක 39 හි බලයලත් වෙන්දේසිකාර එම්.එච්. පී. සිරිවර්ධන විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.12 වැනි දින පස්වරු 3.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ උඩබැරගම ග්‍රාමයේ පිහිටි උඩගමබැරබැද්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. රංචාගොඩ විසින් සැකසුණු 1995.11.02 දින හා අංක 4273 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 1 රූ. 0 පර්. 28.6ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක හම් 515/94 ඒ යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 4273 දරන පිඹුරේ කැබලි අංක 3 මතින් හිමි මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 ජූනි මස 16 වැනි දින,
කොළඹ 3,
ගාලු පාරේ අංක 269.

06-796/4

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 10/57916/ඩී10/264.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2001.07.06 දින *ගැසට් පත්‍රයේ* සහ 2002.12.16 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මාතර, කොටුව,විල්ප්‍රඩ් ගුණසේකර මාවත, අංක 39 හි බලයලත් වෙන්දේසිකාර එම්.එච්. පී. සිරිවර්ධන විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.12 වැනි දින පෙරවරු 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසයේ උඩබැරගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උඩබැරගම පිහිටි දිවුල්ගහලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. රංචාගොඩ විසින් සැකසුණු 1995.04.01 දින හා අංක 4189 දරන පිඹුරේ කැබලි අංක 94 ඒ (මෙම ඉඩම සර්වේයර් ජනරාල්වරයා භාරයේ ඇති අයි. එස්. පී. පී. 08 හි කැබලි අංක 94 ලෙස දැක්වේ) ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 1, රූ. 0, පර්. 8ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක හම් 24/1135/87 බී යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 16 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-796/7

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 10/62440/ඩී10/395.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002.05.31 දින *ගැසට් පත්‍රයේ* සහ 2002.12.09 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මාතර, කොටුව,විල්ප්‍රඩ් ගුණසේකර මාවත, අංක 39 හි බලයලත් වෙන්දේසිකාර එම්.එච්. පී. සිරිවර්ධන විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.12 වැනි දින පස්වරු 2.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, උඩබැරගම ග්‍රාමයේ පිහිටි අරෙයිගලමුල්ලෙ බැද්ද කැබලි අංක 335 අයි. එස්. පී. පී. 8 නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. රංචාගොඩ විසින් සැකසුණු 1996.04.10 දින හා අංක 4348 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 2, පර්. 9 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක හම් 426/93 බී යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී පිඹුරේ දැක්වෙන මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 16 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-796/6

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6ඒ/22307/වයි6/515.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002.12.13 දින *ගැසට් පත්‍රයේ* සහ 2003.09.20 වැනිදා ලංකාදීප පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙ හි බලයලත් වෙන්දේසිකාර එච්. හිල්ටන් පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.05 වැනි දින පෙරවරු 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ. කලුතර බැද්දේ, කළුතර තොටමුණේ, කළුතර නගර සභා සීමාවන් තුළ දේසාස්ත්‍ර සිරිනිවස මාවත, වරිපනම් අංක 99/4ඒ දරන ස්ථානයේ පිහිටි කොට්ඹිබාගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. කොඩිකාරගේ විසින් සැකසුණු 1993.02.18 දින හා අංක 1442 දරන පිඹුරේ කැබලි අංක 1 සී 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10.8 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී. 126/202, ජී 45/283 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, බලයලත් මිනින්දෝරු ජේ. කොඩිකාරගේ විසින් සැකසුණු 1992.07.28 දින හා අංක 1340 දරන පිඹුරේ කැබලි අංක 1 ඩී මතින් හිමි මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරි.*

2006 ජූනි මස 16 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-796/10

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/44752/එච්6/912.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.04.15 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.06.13 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙහි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.05 වැනි දින පස්වරු 3.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය සභාවේ හොරවල උප කාර්යාල සීමාවන් තුළ හොරවල පිහිටි කැබලි අංක 29 කටුවාලගොඩවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඩී. එල්. විජේනායක විසින් සැකසුණු 2001.01.21 දින හා අංක 1403 දරන පිඹුරේ කැබලි අංක 29 සී ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 16.58ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 353/124 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරි.*

2006 ජූනි මස 16 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-796/9

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : එස්-6ඒ/24868/ජීඒ1/235-6/34906/ජී6/224.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2001.11.29 දින *ගැසට් පත්‍රයේ* සහ 2003.04.16 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙහි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.05 වැනි දින පෙරවරු 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මොරවින්න පිහිටි කැටගොඩදෙනිය නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. සී. පී. ප්‍රනාන්දු විසින් සැකසුණු 1993.08.22 දින හා අංක 1,566 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 11.70 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එෆ් 279/146 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 1,566 දරන පිඹුරේ කැබලි අංක 4 මතින් හිමි මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරි.*

2006 ජූනි මස 16 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-796/5

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/31370/ටී6/570.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002.10.04 දින *ගැසට් පත්‍රයේ* සහ 2003.08.02 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙහි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.05 වැනි දින පස්වරු 1.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, අළුත්ගම පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු සිරි බෝපෙ ආරච්චි විසින් සැකසුණු 1996.08.20 දින හා අංක 2090 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ.0, පර්. 18.75 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කො ටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 102/191 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරි.*

2006 ජූනි මස 16 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-796/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 18/10680/ඩී18/694.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2001.01.19 දින *ගැසට් පත්‍රයේ* සහ 2001.03.24 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය ගම්පහ, උසාවිය පාරේ, සණස චතුරශ්‍රයේ, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.08.17 වැනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගලපිටියාගම පිහිටි දංගහමුලහේන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. අතපත්තු විසින් සැකසුණු 1986.05.27 දින හා අංක 86/26 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 12.50ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 18/203 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරි.*

2006 ජූනි මස 16 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-796/11

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 3/67116/ඩී 3/856.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2001.06.22 දින *ගැසට් පත්‍රයේ* සහ 2002.05.18 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මීගමුව, ප්‍රනාන්දු මාවත, අංක 22 හි බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. පී. සී. පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.07.29 වැනි දින පස්වරු 3.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ වෙනිවැල්කඩුව පිහිටි හම්බන්තැල්ලේහේන (දැන් වත්ත) නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක විසින් සැකසුණු 1993.11.22 දින හා අංක 1452 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන්

අ. 1, රූ. 1, පර්. 18ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 1061/188 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 ජූනි මස 16 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

06-796/1

---

## ගල්කිස්ස දිසා අධිකරණයේ දී ය

### ගල්කිස්ස "බීච් පාරේ" අංක 37/2 දරන විශාල දෙමහල් නිවස සහිත පර්චස් 52.30 ක බිම් කොටස ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සන්තා රක්ෂිත වික්‍රමනායක,
අංක 362/3, හයිලෙවල් පාර, නුගේගොඩ.
(දැනට කොළඹ 05, හැව්ලොක් පාරේ –
අංක 15, කිංගස් කෝන් එපාර්ට්මන්ට් 7/5)

පැමිණිලිකරු ........................

නඩු අංක 228/97/
බෙදුම්

එදිරිව

1. ඉලංග දේවප්‍රිය වික්‍රමනායක,
අංක 112, පිරිවෙන පාර, ගල්කිස්ස.

2. එලාර බලභද්‍ර වික්‍රමනායක,
අංක 37/2, බීච් පාර, ගල්කිස්ස.

විත්තිකරුවෝ............................

මෙහි පහත උපලේඛනයේ වැඩි වශයෙන් විස්තර කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එයින් ලැබෙන මුදල් නඩුවේ පාර්ශ්වකරුවන් අතර බෙදා දිය යුතු බව ප්‍රකාශයට පත් කරමින් ගල්කිස්ස දිසා අධිකරණය විසින් මෙම නඩුවේ ප්‍රකාශිත 2002.03.05 දිනැති අතුරු තීන්දු ප්‍රකාශය අනුව එකී දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා වෙන්දේසිකරු/උසාවි කොමසාරිස් ලෙස එම අධිකරණය විසින් මා පත්කර ඇත.

එසේ පත්කරනු ලැබූ අධිකාරී බලය මත එම දේපළ 2006.07.11 වැනි දින පෙ. ව. 10.30 ට මා විසින් දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීමේ මාර්ගය.*– කොළඹ සිට ගාලු පාරේ ගාල්ල දෙසට යන විට දෙහිවල නගරය සහ පොදු සුසාන භූමිය පසුකළ විට දකුණු පසට (මුහුදු පැත්ත) ඇති බීච් පාරේ කෙළවර වම්පස අංක 37/2 දරන මෙම ස්ථානය පිහිටා ඇත.

*දේපළ පරීක්ෂා කිරීම.*– 2006.06.24 සහ 2006.06.25 දිනවල පෙ. ව. 10.30 ප. ව. 2.30 අතර කාලය තුළ දී දේපළ පිහිටි ස්ථානයේ දී මා ඉදිරිපිට දී දේපළ පරීක්ෂා කළ හැක. වෙනත් දින දී වුව ද මා සමග කථාකර (2851977) එම කාර්යය ඉටුකළ හැක.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසන් කළ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් එවේලේ ම මුදලින් හෝ බැංකු අණකරයකින් වෙන්දේසිකරුට ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මිලෙන් 25%ක්, (2) දෙහිවල – ගල්කිස්ස මහ නගර සභාවට වෙළඳ බදු 01%ක්, (3) තක්සේරු ගාස්තු සහ වෙන්දේසිය සඳහා කරන ලද සියලුම වියදම්, (4) 02 1/2%ක, වෙන්දේසිකරුගේ කොමිස්, (5) විකිණීමේ කොන්දේසි සහතික කිරීමට නොතාරිස් ගාස්තු, ලිපිකරු සහ සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 75% මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මෙම නඩුවේ බැරට ගල්කිස්ස දිසා අධිකරණයේ තැන්පත් කළ යුතුය. මෙසේ ඉතිරි 75%ක මුදල නියමිත දිනට හෝ ඊට පෙර ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති 25%ක මුදල රාජසන්තක කරනු ලැබේ. අනෙකුත් ගෙවීම් කිසිවක් ආපසු ගෙවනු නොලැබේ.

අධිකරණය විසින් වෙන්දේසිය ස්ථිර කළ පසු ගැණුම්කරුගේ වියදමින් විකිණීමේ සහතිකය අධිකරණය විසින් නිකුත් කරනු ඇත. අනතුරුව දේපළේ හිස් භුක්තිය පිස්කල් මගින් ගැණුම්කරුට ලබාගත හැක.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව තුළ පිහිටි බීච් පාරේ (වෙරළ පාරේ) ගල්කිස්ස වත්ත වරිපනම් අංක 37/2 දරන පරිශ්‍රය වූ ඩී. ආර්. කුමාරගේ මිනින්දෝරුතැන විසින් මැන සකස් කළ 1998.08.19 දිනැති අංක 586 දරන පිඹුරේ ප්‍රකාර මායිම් උතුරට: වෙරළ පාර වරිපනම් අංක 43 සහ 37/3 දරන දේපළ ද, නැගෙනහිරට: අඩි 20ක් පළල පුද්ගලික පාර සහ වෙරළ පාර වරිපනම් අංක 37/4 දරන දේපළ ද, දකුණට: සමුද්‍රාසන්න මාවත සහ බස්නාහිරට: රේල් පාර ද, යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් දොළහයි දශම තුනයි බින්දුවක් (අ. 0, රූ. 1, පර්. 12.30) *හෙවත්* හෙක්ටයාර් (0.013238) විශාල ඉඩම සහිත නිවස දේපළ වෙයි.

පෙර ලියාපදිංචිය එම්. 1921/99.

නිමිකම් ඔප්පු, ප්ලෑන් ආදිය පිළිබඳව වැඩි විස්තර කොළඹ 07, ග්‍රෙගරි පාරේ, අංක 59 හි නීතිඥ සහ නොතාරිස් පොල් රත්නායක ඇසෝසියේට්ස් (නීතිඥ දිනේෂා මිරිහාන මෙනවිය) වෙතින් ලබා ගත හැක.

දුරකථන අංක : 2768048-49, 2688844-47.

ජේ. චන්ද්‍රසේකර, (සා. වි.)
වෙන්දේසිකරු/උසාවි කොමසාරිස්.

2006 ජූනි 15 වැනි දින,
අංක 140/7, ඇරැව්වල පාර,
පන්නිපිටිය.
දුරකථන අංක :2851977.

06-724

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0200002276.

ණයකරුගේ සම්පූර්ණ නම : වන්නිනායක ආනන්ද වීරසිංහ.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2004.12.10 වන දින අංක 1,371 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2005.02.18 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 15, ස. ණ. ස. සංකීර්ණය, උසාවිය පාර, ගම්පහ ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර වන ටී. එම්. එස්. පීරිස් මයා විසින් 2006.07.21 වන දින ප. ව. 02.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ පනස්එක්දහස් අටසිය අනූපහයි ශත තිස්නවයක (රු. 2,51,895.39) මුදලක් වර්ෂ 2004.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂයක (රු. 2,00,000) මුදල ද, 2004.06.30 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් පනස්එක් දහස් අටසිය අනූපහයි ශත තිස්නවයක (රු. 51,895.39) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ පනස්එක්දහස් අටසිය අනූපහයි ශත තිස්නවයක (රු. 2,51,895.39) ද,

(2) එකී රුපියල් දෙලක්ෂයක (රු. 2,00,000) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14.90% බැගින් වන පොලියක් 2004.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ, අළුත්කුරු කෝරළේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ පිල්ලවත්ත ග්‍රාමයෙහි පිහිටි පිල්ලවත්ත නමැති ඉඩමට 2000.06.15 දින පී. ඩී. එන්. පීරිස් මානක තැන විසින් මැන සම්පාදිත අංක 1650 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, උතුරට: ලක්ෂ්මන් සිල්වා හිමිකම් කියන ඉඩම ද ; නැගෙනහිරට : ධම්මික උදයකුමාර හිමිකම් කියන ඉඩම ද ; දකුණට : අඩි 8ක් පළල මාර්ග රක්ෂිතය ද ; බටහිරට: පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි දශම තුනක් (අ. 0, රු. 0, පර්. 15.3) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමඟ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 807/262හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2006 ක් වූ ජූනි මස 16 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

06-788

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0300001375.

ණයකරුගේ සම්පූර්ණ නම : මුතුවන ආචාරිගේ සුජාතා සහ දොන් අනුර ලියනගේ.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2003.07.18 වන දින අංක 1,298 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2003.07.19 වන දින "දිනමිණ", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 228/ඒ, වලව්වත්ත, කැස්බෑව යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර වන ඒ. එස්. ලියනගේ මයා විසින් 2006.07.18 වන දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ දහඅටදහස් හත්සිය හැත්තෑපහයි ශත දොළහක (රු. 1,18,775.12) මුදලක් වර්ෂ 2002.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අසූනව දහස් එකසිය එකොළහයි ශත දහහතරක (රු. 89,111.14) මුදල ද, 2002.09.30 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිනව දහස් හයසිය හැටතුනයි ශත අනූඅටක් (රු. 29,663.98) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ දහඅටදහස් හත්සිය හැත්තෑපහයි ශත දොළහක (රු. 1,18,775.12) ද,

(2) එකී රුපියල් අසූනව දහස් එකසිය එකොළහයි ශත දහහතරක (රු. 89,111.14) මුදල මත අයවිය යුතු වර්ෂයකට 16.40% බැගින් වන පොලියක් 2002.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

දේපළ පිළිබඳ විස්තරය

